# බැමිණිවත්ත

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ක්ෂේත්‍ර මධ්‍යස්ථානය බැමිණිවත්තයි.

බැමිණිවත්ත තිබෙන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයේ; මාවනැල්ල හංදියේ සිට හෙම්මාතගම පාරේ බස් එකෙන් යනවා නම් සත පහලොවක පමණ දුර. බැමිණිවත්තේ කෘෂිකර්ම පලදු වර්ධන කමිටුවට අයිති බල ප්‍රදේශය අක්කර 26,000 ක් විතර වෙනවා. මේ මුළු ප්‍රදේශයම අපේ ක්ෂේත්‍ර මධ්‍යස්ථානයට අයිතියි. ඒ කියන්නේ අපේ ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින් කරන්න බලාපොරොත්තු වෙන වැඩ කටයුතුවලට මේ මුළු ප්‍රදේශයම ඇතුලත් වෙනවා. මේ ප්‍රදේශයේ ජනගහණය 54,000 ක් විතර ඇති. පවුල් වශයෙන් බලනකොට හත් අට දහක් විතර වෙනවා. මෙයින් පවුල් 4000 ක් පමණ ගොවිතැන් වැඩවල යෙදී සිටිනවා.

ඔවුන්ගේ ප්‍රශ්න අවබෝධ කර ගන්න අපේ ආයතනයේ අය හැකි තරම් කාලය යොදවනවා ඇති. බැමිණිවත්තේ ගොවීන්ගේ ඉඩම් බුක්තිය ගැනත්, ඔවුන් වගා කරන ඉඩම් ප්‍රමාණය ගැනත් අපි හොයා බලනවා. ඔවුන් ඒ ඉඩම් වගා කරන්නේ අයිතිකාරයින් හැටියටද? අඳේටද? එහෙම නැත්නම් වෙන ක්‍රමයක් උඩද? ඔවුන් ඉඩමෙන් ගන්නා ප්‍රයෝජන මොනවාද? ගොඩ මඩ දෙකම ගොවිතැන් කරනවාද? බෝග ජාති සහ සතුන් වර්ග කළවමේ යොද තිබෙනවාද? බීජ, පෝර යනාදී දේවල් හොයා ගන්න අමාරුද? බැමිණිවත්තේ ගොවීන්ගේ ප්‍රශ්න ගැන අපි හොයා බලන්නේ මේ ආකාරයටයි. ඔවුන්ට තිබෙන ණය පහසුකම් මොනවාද? අස්වැන්න විකුණා ගැනීමට වාහන පහසුකම් තිබෙනවාද? ගොවිපලෙන් ලැබෙන අස්වැන්නවලට හොඳ (සාධාරණ) මිලක් ලැබෙනවාද? යන කරුණු ගැනත් ඊලඟට සොයා බලන්නයි අපේ බලාපොරොත්තුව. හැම ගොවියෙක් සමඟම ඉතා කිට්ටුවෙන් දන ඇඳුනුම්කම් ඇති කරගෙන මේ වගේ නොයෙක් ප්‍රශ්න ගැන දැන ගන්න අපි කටයුතු කරනවා.

බොහොම සීරුවෙන් මේ ප්‍රශ්න ගැන දැනීමක් ලබාගෙන, දැන් පවතින තත්වය තේරුම් ගත්තාට පස්සේ, එක එක ප්‍රශ්නයට වෙන වෙනම පිළියම් හොයන්නයි අපි වෑයම් කරන්නේ. ඒ වගේම ගොවිතැන් කටයුතුවල තත්වය දියුණු කරන්න පුළුවන් අළුත් ක්‍රම ගැනත් හොයා බලනවා.

ගොවිතැන් කිරීමෙන් සාර්ථක අන්දමට ගොවියාට ලාබ ලැබෙනවාද? ඒ කියන්නේ ගොවියාගේ මහන්සියට හරියන තරම් ලාබයක් ලැබෙනවාද කියන එකයි. ඒ අතරම ඔහුගේ පවුලේ හෝ පිටස්තර අයට ඒ මාර්ගයෙන් කොයි තරම් දුරට රක්ෂාවල් ලබා ගන්න පුළුවන්ද? යන කරුණු ගැන සොයා බැලීමයි අපි ඊලඟට කරන්නේ.

මේ තොරතුරු හැම එකක්ම එක්කාසු කර, ඒවා විග්‍රහ කර බලා, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනවා. ගොවිතැනට සම්බන්ධ කරුණු ගැන වෙනස්කම් ඇති කිරීම හෝ තීරණ ගැනීම අමාත්‍යාංශයට අයිති වැඩක්. ඒක ඔබ දන්න කාරණයක්. නිසි වෙලාවට නිසි තීරණ ගැනීම සඳහා පුළුවන් තරම් තොරතුරු එකතු කර ගැනීම අමාත්‍යාංශයට උවමනායි. මේ වැඩ පිළිවෙල මාර්ගයෙන්—ඒ කියන්නේ බැමිණිවත්තේ ක්ෂේත්‍ර මධ්‍යස්ථානයේ කෙරෙන වැඩ කටයුතුවල ආධාරයෙන්—අපි බලාපොරොත්තු වෙන්නේ, තීරණ ගන්නා අයට ඒ වැඩේ ලේසි කිරීම සඳහා හැකි තරම් නිවැරදිවූත්, විශ්වාසදයක වූත් තොරතුරු ලබා දෙන්න.

රජයේ තීරණ ක්‍රියාත්මක කරන්නේ නොයෙක් මාදිලියේ නිලධාරීන්ගේ මාර්ගයෙන්. රජයේ නිලධාරීන්, ග්‍රාමීය ආයතනවල සාමාජිකයින් සහ නොයෙක් මට්ටම්වල සේවකයින් මීට ඇතුළත් වෙනවා. මේ අය එකකට එකක් වෙනස් තනතුරු දරණ අතර, නොයෙක් රාජකාරිවල නියුක්ත වී සිටිනවා. තමන්ගේ රාජකාරිය නිසියාකාරව ඉෂ්ට කරන්න නම් ඔවුන්ට පුහුණු වීමක් අවශ්‍යයි. නියම විදිහට කියනවා නම්, පුහුණුවීම කියන්නේ මිනිසුන්ගේ යල් පැනපු මත වෙනස් කර ඒ වෙනුවට තත්වයට ගැලපෙන වඩා හොඳ ක්‍රමවලට ඔවුන් පුරුදු කිරීමයි. අපේ ක්ෂේත්‍ර මධ්‍යස්ථානයෙන් කරන්න හදන්නේ ඒ ටිකමයි. මේ මධ්‍යස්ථානය වැඩ කරන හැටි දැක බලා ගැනීම සඳහා කණ්ඩායම් වශයෙන් ගොවීන් බැමිණිවත්තට කැඳවා ගෙන එන්න අපි අදහස් කරනවා.

බැමිණිවත්තේ ගොවිතැන් කටයුතුවල තත්වය ගැන අපට ලැබෙන දැනීමේ ආධාර-

යෙන් ඒ පලාතේ සේවය කරන බොහෝ දෙනා ලවා යම් යම් වෙනස්කම් ඇති කරවන්නයි අපේ බලාපොරොත්තුව. එතකොට තව ප්‍රශ්න වැලක් මතු වෙනවා. මේ නවාංග නොහොත් අළුත් වෙනස්කම් ක්‍රියා කරන්නේ කොහොම ද? ඒවායින් ගොවියාට වාසියක් ලැබෙනවාද? මේ කටයුතු ගැන සොයා බැලීමට පත්කර සිටින තැනැත්තා—ඒ කියන්නේ රජයේ නිලධාරියා—උවමනා වෙලාවට මුණ ගැහෙන්න පුළුවන්ද? ඔබට උපකාර කිරීමට ඔහු සූදනම්ද? මේ වගේ ප්‍රශ්න තමයි මතු වෙන්නේ. මේ හැම කාරණයක්ම පරිස්සමෙන් අවබෝධ කර ගන්න ඕනෑ. එතකොට මොකක්ද වෙන්නේ? මුලින් පටන් ගත් තැනටම අපි නැවතත් පැමිණෙනවා. මේ ආකාරයෙන් නැවත නැවතත් අපේ වැඩ පිළිවෙල ගෙනියනවා.

රටේ හැම තැනම විහිදී සිටින ලක්ෂ ගණන් ගොවීන්ගේ ප්‍රශ්න ගැන වෙන වෙනම හොයා බලන්න අමාරුයි. නමුත් එක පලාතක ඉන්න ගොවීන්ගේ ප්‍රශ්න ගැන ඉතා කිට්ටුවෙන් හොයා බලා ඒවාට සතුටුදයක පිළියම් යෙදෙව්වොත්, ඒ වගේම ප්‍රශ්න තිබෙන වෙන පලාතකටත් එම පිළියම් හරියන්න පුළුවනි. අවශ්‍ය නම් ඒ ඒ පලාත්වල තිබෙන තත්වයට ගැලපෙන හැටියට සුළු වෙනස්කම් ඇති කරන්න සිදු වේවි.

තෙත් කලාපයේ ගොවීන්ගේ සමහර ප්‍රශ්න ගැන අවබෝධයක් ඇති කර ගන්නත් බැමිණි-වත්ත ක්ෂේත්‍ර මධ්‍යස්ථානය නිසා අපට පුළුවන් වෙනවා. කල් ගත වෙන කොට තවත් ක්ෂේත්‍ර මධ්‍යස්ථානයක් වියලි කලාපයේ පිහිටුවන්නයි අපේ බලාපොරොත්තුව. ඒ මාර්ගයෙන් වියළි කලාපයේ ගොවිතැන් ප්‍රශ්න ගැන හොඳ අව-බෝධයක් ඇති කර ගන්න අපට අවස්ථාව ලැබෙනවා.

බැමිණිවත්තේ වැඩ කටයුතු කරන්න අපි යන්තම් පටන් ගත්තා විතරයි. ඒ වැඩ කටයුතු යම්කිසි තත්වයකට ගෙනෙන්න කල් ගත වේවි. ඇත්ත වශයෙන්ම අපි කරන්න බලාපොරොත්තු වෙන කටයුත්ත භාර දූර එකක්. මේ ක්ෂේත්‍ර මධ්‍යස්ථානයේ කරන්න අදහස් කරන කටයුතු අපි පටන් ගන්නේ ඉතාම නිහතමානී ගතියකින් යුතුව. අපි විශ්වාස කරන්නේ නැහැ මේ ප්‍රශ්න හැම එකකටම පිළියම් අපේ අතේ තිබෙනවා කියා. ගොවිතැන් කටයුතු ගැන අපට විශාරද දැනුමක් තිබෙනවා කියාවත් අපි හිතන්නේ නැහැ. ඇත්ත වශයෙන් කියනවා නම්, ගොවියා වන ඔබට පුළුවනි කරුණු රාශියක් ගැන අපට ගුරුහරුකම් දෙන්න. ඔබටත් ඔබේ පවුලේ අයටත් අපේ ඉමහත් ගෞරවාදරය දක්වමින් අපි ඔබ අතරට එන්නේ ඔබෙන් කරුණු දැන ඉගෙන ගෙන, ඔබේ තත්වය උසස් කරන බලාපොරොත්තුවෙන්.

## ගොවීන්ගේ කතා පුවත්

17 වැනි පිටුවෙන්

කරන කලාපවල ඇතුළත් කිරීමට මෙම ආයතනය අදහස් කරනවා. අපට මුණගැසීමට නොහැකිවන ඇතැම් ගොවිමහතුන්, ඔවුන් ගොවිතැන් කටයුතුවලදී මුහුණ දෙන නොයෙක් ප්‍රශ්න පිළිබඳව අප සමග කථාකිරීමට කැමති වන්නට පුළුවන්. සමහර විට තමන්ටත් අනෙක් ගොවි මහතුන්ටත් වැඩදයක යෝජනා ඉදිරිපත් කිරීමට ඒ අයට තිබෙනවා වෙන්නට පුළුවනි. ඒ වගේ කරුණු, ඔබේ සහරාව වන "ගොවි ජනතාව" සහරාවේ පළකිරීමට අපි සැමවිටම සූදනම්. මේ සම්බන්ධයෙන් සියළුම ලියුම්,

ප්‍රකාශන අංශය,
ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය,
33, එළිබැන්ක් පාර,
කොළඹ 5.

යන ලිපිනයට එවන්න.

## සුළු අපනයන බෝග

22 වැනි පිටුවෙන්

බැංකුවේ නිලධාරීන්ට ඔබේ ඉඩම සහ වගාව පරීක්ෂා කර බැලීමට ඉඩ දිය යුතුයි. මෙයින් අදහස් කරන්නේ ඔබ ලබා ගන්නා ආධාර සහ ණය පහසුකම් නියම පිළිවෙලට ප්‍රයෝජනයට ගෙන තිබෙනවාද යනුවෙන් සොයා බැලීම පමණයි. එසේම වගාව නියම තත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, ඔබ ලබා ගත් ණය මුදල් සහ පොළිය ආපසු ගෙවීමට ඔබ බැඳී සිටිනවා.

අද පවතින තත්වය අනුව අනාගතයේදී කජු, කොකෝවා, ඇඹිල්ල, ගම්මිරිස් යනාදී සුළු අපනයන බෝග සඳහා හොඳ වෙළඳ පොලක් ඇතිවන බව පැහැදිලියි. එමනිසා මෙම බෝග වගාවන් දියුණු කිරීමෙන් ගොවි ජනතාවගේ ආදයම් මට්ටම විශාල අන්දමින් ඉහළ යන අතර, ඒ මගින් විශාල ප්‍රමාණයකට රැකියා පහසුකම් සැලසෙනවා නොඅනුමානය. ඒ වගේම සුළු අපනයන බෝග වගා කිරීම විදේශ විනිමය උපයා ගැනීමේ හොඳ මාර්ගයක් ද වෙනවා ඇත.